WORKED.


# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,590—1958 නොවැම්බර් 21 වැනි සිකුරාද—21.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 3447 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 3448 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 3449 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 3450 |
| මිළ පාලන දැන්වීම .... .... .... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 3454 |
| "සුරාබද්ද ආඥාපණත" පිළිබඳ දැන්වීම් ... | 3455 |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1958 අංක 500**

අ. ආ. කා. අංකය : C. 162/49 (II).

කම්කරු, නිවාස හා සමාජසේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ආර්. ඇම්. ගිබන් මනිපෙනි මහතාට නිවාඩු දී ඇති කාලය තුල, 1946යේ හා 1957තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 51(1) වැනි වගන්තිය යටතේ, කම්කරු කොමසාරිස් සී. බී. කුමාරසිංහ මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1958වේ දෙසැම්බර් මස 1 වැනි දින සිට, කම්කරු, නිවාස හා සමාජසේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත්කළ බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 නොවැම්බර් මස 19 වැනි දින,
අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය, කොළඹ,

---

**1958 අංක 501**

අ. ආ. කා. අංකය: X 28/58.

1947තේ අංක 26 දරණ අධ්‍යාපන ආඥා පනතින් සහ 1951කේ අංක 5 දරණ අධ්‍යාපන (සංශෝධිත) පනතින් සංශෝධනය කරන ලද 1939යේ අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනතේ 43 C වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, ආධාර නොලබන පාසැල් සඳහා පහත සඳහන් මහත්මයින්ගෙන් යුත් ඇපීල් මණ්ඩලයක්, 1958 වේ දෙසැම්බර මස 1 වැනි දින සිට අවුරුදු තුනක කාලයකට පත් කළ බව මෙයින් නිවේදනය කරණු ලැබේ:—

1. ඇෆ්. බී. කොක් මහතා,
2. කර්නල් වෝල්ඩො සන්සෝනි මහතා, ඕ.බී.ඊ., වී.ඩී.,
3. ආර්. ආර්. සෙල්වදුරෙයි මහතා,
4. ඇල්. ඩබ්ලිව්. ද සිල්වා මහතා,
5. ටී. පී. පී. ගුණතිලක මහතා,
6. ජේ. විල්මට් පෙරේරා මහතා,
7. ජී. ක්‍රොසට්-තම්බයියා මහතා., සී.ඇම්.ජී,
8. ඇම්. සෝමසුන්දරම් මහතා,
9. කේ. ඒ. පී. රාජකරුනා මහතා,
10. ජී. පී. ජේ. කුරුකුලසූරිය මහතා,
11. අයිවර් මීසෝ මහතා,
12. ඇස්. ඒ. මරිකාර් මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 නොවැම්බර් මස 18 වැනි දින,
අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය, කොළඹ.

---

**1958 අංක 502**

අංකය : ඩී. 31/රෙක්ට්.

### යුධ හමුදුව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමතකරන ලද උසස් කිරීම

තාවකාලික කපිතන් වරුන් වශයෙන්—

ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඒ. ඩබ්ලිව්. යෝගරාජා, සී. ඒ.—1958 ජනවාරි මස 30 වැනි දින සිට.

ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඇම්. ජෝර්ජ්, සී. ඒ. සී—1958 අගෝස්තු මස 11 වැනි දින සිට.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ 1.

**1958 අංක 503**

අංකය : ඩී. 1/රෙක්ට්/13.

**යුධ හමුදව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1958 අගෝස්තු මස 8 වැනි දින සිට, ලෙප්ට්ටිනන්ට්වරුන් වශයෙන්—

උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ජේ. ඇල්. සී. කොරේරා, සී. ඒ.,
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් සී. එච්. ප්‍රනාන්දු, සී. ඒ. සී.,
උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඇස්. ඩබ්ලිව්. ජයසේකර, සී. ඒ. ඕ. සී.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් 11 වැනි දින,
කොළඹ 1.

---

**1958 අංක 504**

අංකය : ඩී/වීඇf්ජ/12/ඒ.

**යුධ හමුදව—ලංකා ස්වේච්ඡා හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍ර**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කරන ලද මහත්වරුන්, 1958 නොවැම්බර් මස 1 වැනි දින සිට, යුද්ධ හමුදවේ ලංකා ස්වේච්ඡා හට සේනාවේ උප ලෙප්ට්ටිනන්ට් වරුන් වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධූරවලට පත්කිරීම සහ ඔවුන් පහත සඳහන් කරන ලද ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලට ලංකා සිංහ රෙජිමේන්තුවේ 2 වැනි ස්වේච්ඡා හට සේනාවට ඇතුළත් කිරීම අනුමත කොට තිබේ:—

නිහාල් පීටර් ඩොනල්ඩ් පැල්පොල මහතා
චන්ද්‍රා නිශ්සංක පානබොක්ක මහතා

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් 17 වැනි දින,
කොළඹ 1.

---

**1958 අංක 505**

අංකය : ඩී. 22/රෙක්ට්/8.

**රාජකීය ලංකා නාවුක හමුදවේ නිලධාරියෙකු නිත්‍ය නාවුක හමුදවෙන් නිත්‍ය නාවුක උප සේවයට මාරුකිරීමක්**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1958 නොවැම්බර් මස 1 වැනි දින සිට පහත සඳහන් කරනලද නිලධාරි තැන නිත්‍ය නාවුක හමුදවෙන් නිත්‍ය නාවුක උප සේවයට මාරුකිරීම අනුමත කොට තිබේ :—

ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඩබ්ලිව්. ධර්මදස — රාජකීය ලංකා නාවුක හමුදව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 5 වැනි දින,
කොළඹ 1.

---

**1958 අංක 506**

අංකය : ඩී. 10/රෙක්ට්.

**රාජකීය ලංකා නාවුක හමුදවේ නිලධාරීන් ස්ථිර කරිමක්**

පහත සඳහන් කරන ලද නිලධාරීන්, 1957 ඔක්තෝබර් මස 1 වැනි දින සිට, කොමිෂන් බලපත්‍ර ලත් නිලධාරීන් (ශාඛා තනතුර) වශයෙන් එම තනතුරෙහි ස්ථිර කොට ඇත —

වැඩබලන කොමිෂන් බලපත්‍ර ලත් බෝසන් තැන්පත් ඊ. සී. කෙලාර්ට්, රාජකීය ලංකා නාවුක හමුදව.

වැඩබලන කොමිෂන් බලපත්‍ර ලත් බෝසන් තැන්පත් බී. ජී. ජයසිංහ, රාජකීය ලංකා නාවුක හමුදව.

වැඩබලන කොමිෂන් බලපත්‍ර ලත් බෝසන් තැන්පත් ඇම්. එච්. වැලිවිටිගොඩ, රාජකීය ලංකා නාවුක හමුදව.

වැඩබලන කොමිෂන් බලපත්‍ර ලත් විදුලි නිලධාරි (ආර්) තැන්පත් ආර්. ඇf්ජ. ඇම්. ඇන්ඩ්‍රි, රාජකීය ලංකා නාවුක හමුදව.

වැඩබලන කොමිෂන් බලපත්‍ර ලත් සැපයීම් නිලධාරි තැන්පත් ඇස්. ඩී. ප්‍රැන්සිස්කස්, රාජකීය ලංකා නාවුක හමුදව.

වැඩබලන කෙමිෂන් බලපත්‍ර ලත් සැපයීම් නිලධාරි තැන්පත් ඇf්ජ. ඒ. ඇම්. පීරිස්, රාජකීය ලංකා නාවුක හමුදව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 8 වැනි දින,
කොළඹ 1.

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 507**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේජ්. 3/48.

වී. එම්. කුමාරසාමි මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1958 නොවැම්බර් 8 වැනි දින, අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 34,202 හා 34,259 නඩුවල තීන්දුව දීමට, අවිස්සාවේල්ලේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 3,1623 නඩුවේ කරුණු කියා දීමට හා අවිස්සාවේල්ලේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 32,225 නඩුව ඇහීමට, අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 6බී/57.

බී. ඊ. ද සිල්වා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා, 1958 නොවැම්බර් 6 වැනි දින පටන් 11 වැනි දින දක්වා, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ එල්/27ඒ/51.

අයි. එම්. ඉස්මයිල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. ජී. ද සිල්වා මහතා 1958 නොවැම්බර් 20 වැනි දින පටන් 22 වැනි දින දක්වා, අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 59ඒ/56.

ඒ. එම්. එf්ජ. සිරිවර්ධන මහතා නැති අතර,හෝ නැවත නියමයක් කරන තුරු, ටී. බී. යටවර මහතා,1958 නොවැම්බර් 8 වැනි දින පටන් 11 වැනි දින දක්වා හා 21 වැනි දින, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 68/48.

ජී. තෝමස් මහතා නැති අතර හා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු ටී. එf්ජ. බලාසේ මහතා 1958 නොවැම්බර් 7 වැනි දින හා 11 වැනි දින පටන්, බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේජ්. 40/48.

බී. ආර්. ජී. විජෙයකෝන් මහතා,1958 නොවැම්බර් 22 වැනි දින, මාතලේ මහෙස්ත්‍රාත් උස වියේ අංක 3,454 නඩුව ඇහීමට, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා මහනුවර මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඉලෙයතම්බි මහතා, 1958 නොවැම්බර් 26 වැනි දින, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට හා යාපනේ මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ එල්. 67ඒ/58.

ඩබ්ලිව්. ඩී. තාමෝදරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. ද ඉසෙඩ් ගුණවර්ධන මහතා, 1958 නොවැම්බර් 8 වැනි දින පටන් 11 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එච්. ප්‍රනාන්දු මහතා, 1958 නොවැම්බර් 12 වැනි දින පටන් 17 වැනි දින දක්වා, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ/එල්. 62ඒ/57.

ජේ. එෆ්. ඒ. සෝස මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. එෆ්. බිලාසේ මහත,ා 1958 නොවැම්බර් 20 වැනි දින පටන්, බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් කොමසාරිස් ධූරයට, හා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 71ඒ/51.

ඩී. විමලරත්න මහතා නැති අතර. හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඕ. සල්ගාදු මහතා, 1958 නොවැම්බර් 11 වැනි දින, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, කොළඹ නාගරික මහෙස්ත්‍රාත් ධූරයට, හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 6බී/48.

ඊ. බී. එස්. කොරෙයා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එච්. ප්‍රනාන්දු මහතා, 1958 නොවැම්බර් 15 වැනි දින පටන් 18 වැනි දින දක්වා, කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ජී. එච්. සඳරත්න මහතා, 1958 නොවැම්බර් 15 වැනි දින පටන් 17 වැනි දින දක්වා, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා කුරුණෑගල, කනදූල්ල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා, 1958 නොවැම්බර් 14 වැනි දින, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා කුරුණෑගල කනදූල්ල උසාවියේ අතිරෙක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : පීඒ. 18/57.

ඊ. ගුණසේකර මහතා, 1958 නොවැම්බර් 19 වැනි දින, දම්පහල ගම්බද උසාවියේ අංක සීආර්එම්. 3,519 නඩුව ඇහීමට, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධූරයට හා වැලිගම් කෝරළේ හා ගහබඩ පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධූරයට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 5/48.

එච්. ඊ. එස්. වික්‍රමරත්න මහතා නැති අතර, එම්.ටී. ටී. ද එස්. අමරසේකර මහතා, 1958 නොවැම්බර් 13 වැනි දින, බලපිටිය දිස්ත්‍රික්කයේ බෙන්තොට-වල්ලාවිටි කෝරළේ හා වැල්ලබඩ පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 10/53.

ටී. බී. වැත්තැව මහතා නැති අතර, ඩබ්ලිව්. සිල්වා මහතා, 1958 නොවැම්බර් 12 වැනි දින, නුවරඑලිය දිස්ත්‍රික්කයේ කොත්මලේ හා වලපනේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 2/48.

සී. ඒ. රත්නායක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එල්. සේනානායක මහතා, 1958 නොවැම්බර් 14 වැනි හා 15 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට, හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජේ. 1/48.

එම්. ටී. ජේනු දීන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. ආර්. සච්චිත්තානන්දන් මහතා 1958 නොවැම්බර් 15 වැනි හා 17 වැනි දිනයන්හි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් හා තම්පලාකාමම් පත්තු ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958 නොවැම්බර් 12 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573, කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

## 1958 අංක 508

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ :—

අංකය : 74/2/121 (එම්. එෆ්).

ඩී. ජී. එල්. මිසෝ මහතා, 1958 නොවැම්බර් මස 1 වෙනි දින පටන්, ඉඩම් හා විවාහ, උප්පැන්න සහ මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන්.

අංකය : 74/48 (එම්. එෆ්).

ආර්. ජී. ජී. ඕ. ගුණසේකර මහතා, 1958 නොවැම්බර් මස 1 වෙනි දින පටන් ග්‍රාම සංවර්ධන හා ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදීමට.

ඒ. ආර්. එම්. ජයවර්ධන මහතා, 1958 නොවැම්බර් මස 3 වෙනි දින පටන් කුරුණෑගල කච්චේරියේ සේවයෙහි යෙදීමට.

වී. සී. බී. උනන්තැන්න මහතා, 1958 නොවැම්බර් මස 3 වෙනි දින පටන් කළුතර කච්චේරියේ සේවයෙහි යෙදීමට.

එස්. එෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1958 නොවැම්බර් මස 17 වෙනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 1.

---

## 1958 අංක 509

අංකය : ඕඇම්. 4/1/11 ඇෆ්.

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරුකිරීම පහත දැනුම් දී ඇති දින සිට බල පැවැත්වේ :—

1958 නොවැම්බර් මස 2 වැනි දින සිට, නැවත නියම කරනතුරු, ලංකා විදේශ සේවයේ හය වැනි පෙළේ පී. ඇම්. ඩී. ප්‍රනාන්දු මහතා රෝමයේ ලංකා තානාපති කාර්යාලයේ සේවය සඳහා.

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් 14 වැනි දින,
සෙනේට් මන්දිරය, කොළඹ 1.

---

## 1958 අංක 510

අංකය : අයි. එන්. කියු/එල් 6/1/57.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 නොවැම්බර් මස 7 වෙනි දින සිට, කේ. ඒ. ද එස්. ආර්. විජේසිංහ මහතා නැවත වැඩභාරගන්නාතුරු, ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරළේ වැලිතර, කොස්ගොඩ සහ ඌරගහ යන විදන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට ලක්ෂමන් විජේසිංහ මහතාද,

1958 නොවැම්බර් මස 11 වෙනි දින සිට, මන්නාරම් දිස්ත්‍රික්කයේ නැගෙනහිර නානන්දන් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය දරණ අතරම, බස්නාහිර නානන්දන් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරයට එස්. එම්. සවන්තු මහතාද,

1958 නොවැම්බර් මස 11 වෙනි දින සිට, එස්.බී. දෙලුන්ගහවත්ත මහතා නැවත වැඩභාරගන්නාතුරු, බදුලු දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ යටිපළාත සහ මැදපළාත කෝරළවල හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට පී. බී. රත්නායක මහතා ද,

1958 නොවැම්බර් මස 14 වෙනි දින සිට, ඒ. එම්. පී. අමරකෝන් මහතා නැවත වැඩභාරගන්නාතුරු, මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ උඩුගම්පහ කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට එච්. බී. කුලතුංග මහතාද,

1958 නොවැම්බර් මස 21 වෙනි දින සිට, ජේ. ගුණතිලක මහතා නැවත වැඩභාරගන්නාතුරු, ගාලු දිස්ත්‍රික්කයේ පිටිගල, ඇල්පිටිය සහ ඕපාත යන විදනආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩබැලීමට ජේ. ඩී. ඒ. ජයසේකර මහතා ද,

ජාතික පුස්

1958 මැයි මස 3 වෙනි දින සිට යාපනේ දිස්ත්‍රික්කයේ පුන්නකාරි-තුනුකෙයි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම්පාළකධුරය දරණ කාලයතුල එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයට වී. බාලසන්තිරම් මහතා ද,

පත්කර ඇත්තේය.

එසේම ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 365 (1) වෙනි වගන්තිය යටතේ අවශ්‍යවූ විට හදිසි මරණ පිළිබඳව වෛද්‍ය පරීක්ෂණ නියම කිරීමේ බලයද ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් බාලසන්තිරම් මහතා කෙරෙහි පවරා ඇත.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 18 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

---

**1958 අංක 511**

වර්ණකුලසූරිය එඩ්වින් පෙරේරා මහතා වාරියපොල වාසස්ථානය සහ කාර්යාලයද ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 7 වෙනි දින,
කොළඹ දීය.

---

**1958 අංක 512**

ධර්මලිංගම් දේවරාජන් මහතා බදුල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 1 වැනි දින,
කොළඹ දීය.

---

**1958 අංක 513**

වර්ෂ 1946යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා නියෝගවල 61 වැනි වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වර්ෂ 1955හේ දෙසැම්බර් මස 30 වෙනි දින නිකුත් කරන ලද අංක 10,842 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ අංක 81 දරණ නියෝගයෙහි සඳහන් ප්‍රකාර ඉන්දියානු හා පකිස්තානු වැසියන් ලියාපදිංචි කිරීමේ වැඩ බලන කොමසාරිස් තැන වෙත පැවරී ඇති බලය කරණකොට මෙහි පහත උපලෙඛනයෙහි 1 වෙනි තීරයෙහි නම් සඳහන් ඉන්දියානු හා පකිස්තානු වැසියන් ලියාපදිංචි කිරීමේ නියෝජ්‍ය කොමසාරිස්වරු ඒ අයගේ නම් ඉදිරියේ 2 වෙනි තීරයෙහි සඳහන් පාලන දිස්ත්‍රික්කවලට උපලේඛනයෙහි 3 වෙනි තීරයෙහි සඳහන් දිනයන්හි සිට පත්කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

මෙතුවක් ඔවුන් වෙත පවරනු ලැබූ ප්‍රදේශ උප ලෙඛනයෙහි 4 වෙනි තීරයෙහි සඳහන් දිනයන්හි සිට අවලංගු කරනු ලැබේ.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පකිස්තානු වැසියන් ලියාපදිංචි කිරීමේ
වැඩබලන කොමසාරිස් තැන.

1958 නොවැම්බර් මස 12 වෙනි දින,
තැ. පෙ. අංක 587, කොළඹ.

උපලේඛනය

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
| ටී. හගවදස් ... | දිවයිනේ පාලන දිස්ත්‍රික්ක සියල්ල | 1.10.58 ... | 30.9.58 |
| ඇම්. ඩී. ටී. ද ඇස්. ගුණවර්ධන | එම ... | 1.10.58 ... | 30.9.58 |
| ඊ. ඒ. වී. ද සිල්වා ... | එම ... | 1.10.58 ... | 30.9.58 |

---

# ආණ්ඩුවේ නිවේදන

## පර්ලිමේන්තු ඡන්දදයක නාම ලේඛන සංශෝධනය—1958

ඡන්දදයක නාම ලේඛනවල පිටපත් හෝ ඒවායින් උපුටා ගන්නා ලද කොටස් හා ඊට අදල " ඒ " සහ " බී " ලැයිස්තු ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයන් ගැන දැනුම් දෙන දැන්වීම්, දිවයිනේ සියළුම මැතිවරණ දිස්ත්‍රික්ක වල ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින්, 1958 නොවැම්බර් 28 වැනි දින ප්‍රසිද්ධ කරනු ලබනවා ඇත. නාම ලේඛනයන්ගෙන් උපුටා ගන්නා ලද කොටස් හා ඊට සම්බන්ධ ලැයිස්තු සාමාන්‍ය වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන්නේ, කච්චේරිය, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය, පළාත් පාලන සභා කාර්යාලය හා ගම්මුලාදෑනි තැනගේ කාර්යාලය යන ස්ථාන වලය.

ඡන්දදයකයකුගේ නම 1958වේ නාම ලේඛනයට ඇතුළත් වනුයේ, එය—

(අ) " බී " අක්ෂරය දරණ ලැයිස්තුවට ඇතුලත්වී තිබුනොත් හෝ,

(ආ) 1957තේ නාමලේඛනයට ඇතුළත්ව තිබුනොත්, හා එය මෙම සංශෝධනයේදී " ඒ " අක්ෂරය දරණ ලැයිස්තුවට ඇතුළත් නොවී තිබුනොත්ය.

සැ.යු.—" බී " ලැයිස්තුව වනාහී මෙම සංශොධනයේදී, නාමලේඛනයට ඇතුළත් කරනු ලබන අළුත් නම් අඩංගු ලැයිස්තුවයි.

" ඒ " ලැයිස්තුව වනාහී මෙම සංශොධනයේදී නාමලේඛනයෙන් කපාගා ඉවත් කරනු ලබන නම් අඩංගු ලැයිස්තුවයි.

යම් ඡන්දදයකයෙක් 1958 ජූනි මාසයට පූර්වයෙන්වූ 18 මාසය තුළ නොකඩවා මාස 6ක කාලයක්, යම්කිසි මැතිවරණ දිස්ත්‍රික්කයක පදිංචිව සිටියේ නම් සහ, අනිකුත් කරුණු වලින් සුදුසුකම් ලබා සිටින්නේ නම්, ඔහුගේ නම මෙම සංශෝධනයේදී ලියාපදිංචි කරවා ගැනීමට ඔහු සුදුසු වන්නේය.

නම් ඇතුළත් කිරීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ කෙරෙන ඉල්ලීම් හෝ නම් ඇතුළත් කිරීම ගැන හෝ තබා ගැනීම ගැන හෝ දක්වන විරුද්ධ වාදිකම් හෝ, ඒ ඒ දිස්ත්‍රික්කවල ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් පිළිගනු ලබන්නේ, එකී අයිතිවාසිකම් හා විරුද්ධවාදිකම් පිළිබඳ ඉල්ලීම්, 1958 නොවැම්බර් 28 වැනි දින සිට 1958 දෙසැම්බර් 26 වැනි දින දක්වා වූ කාලය තුළ ඉදිරිපත් කරනු ලැබුවොත් පමණකි.

කලින් තම තමන් පදිංචිව සිටි ස්ථාන අත්හැර මෑතදී වෙන ස්ථානවල පදිංචිය පිණිස ගොස් සිටින සියළුදෙනා වෙතම විශෙෂයෙන් දන්වා සිටින්නේ නාමලේඛන හා ඊට සම්බන්ධවූ ලැයිස්තු පරීක්ෂාකර බලන ලෙසය. එසේ පරීක්ෂාකර බැලීමේදී තම තමන්ගේ නම් ඇතුළත් කර ගැනීමට අවශ්‍යවී තිබේ නම්, නියමිත කාලය තුළදී, ඔවුන්ට අයිතිවාසිකම් ඉදිරිපත් කළ හැක. අයිතිවාසිකම් ඉදිරිපත් කිරීම සඳහා යෝග්‍ය ආකෘති පත්‍ර, නාමලේඛන හා ලැයිස්තු ප්‍රදර්ශනය පිණිස තබා ඇති කාර්යාලවලින් ලබා ගැනීමට පුළුවන.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්.

1958 නොවැම්බර් 18 වැනි දින,
කොළඹ.

---

**1958වේ පාර්ලිමේන්තු ඡන්දදයක නාම ලේඛන සංශෝධනය කිරීම**

මැතිවරණ දිස්ත්‍රික්ක අංක 1 — උතුරු කොළඹ.
මැතිවරණ දිස්ත්‍රික්ක අංක 2 — මැද කොළඹ.
මැතිවරණ දිස්ත්‍රික්ක අංක 3 — දකුණු කොළඹ.
මැතිවරණ දිස්ත්‍රික්ක අංක 4 — වැල්ලවත්ත–ගල්කිස්ස.

පාර්ලිමේන්තු ඡන්දදයක නාමලේඛන සංශෝධන කිරීමේදී ඉහතකී මැතිවරණ දිස්ත්‍රික්ක වලට අදල දැනට වලංගුව පවතින ඡන්දදයක නාම ලේඛනවල සම්පූර්ණ පිටපත් හා එකී අඩංගු කළ යුතු හෝ ඉන් අස්කළ යුතු හෝ නාම ලේඛන වර්ෂ 1958ක්වූ නොවැම්බර මස 28 වෙනි දින පටන් 1958ක්වූ දෙසැම්බර මස 26 වෙනි දින දක්වා කොළඹ රෙජිස්ට්‍රාර් ජෙනරල් කාර්යාලයේදී මහජනයාට පරීක්ෂා කළ හැකි බව මෙයින් දැනුම් දෙමි.

2. තවද මහජනයාගේ පහසුව සඳහා ඡන්දදයක නාම ලේඛනවල කොටස් හා ඉහතකී පිටපත් පහත සඳහන් ප්‍රකාර ප්‍රදර්ශනය කරනු ලැබේ.

| ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය | ලේඛන කොටස්වල ඇතුළත් ප්‍රදේශ |
|---|---|
| කොළඹ මහ නගර සභා විශේෂ කොමසාරිස් තැනගේ කාර්යාලය | උතුරු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්ක ඡන්ද කොට්ඨාශ A සිට N දක්වා |
| | මැද කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ A සිට Z දක්වා, AA, BB, CC සහ DD |
| | උතුරු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ A සිට Q දක්වා |
| | වැල්ලවත්ත–ගල්කිස්ස මැතිවරණ දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ A සිට E දක්වා |
| දෙහිවල – ගල්කිස්ස නගර සභා කාර්යාලය | වැල්ලවත්ත–ගල්කිස්ස මැතිවරණ දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ F සිට U දක්වා |
| කොළොන්නාව නගර සභා කාර්යාලය ... | උතුරු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ O සිට U දක්වා |
| අඹතලෙන් පහළ ගම්කාර්ය සභා කාර්යාලය | උතුරු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශය V |
| කෝට්ටේ–ගල්කිස්ස ගම්කාර්ය සභා කාර්යාලය | වැල්ලවත්ත–ගල්කිස්ස මැතිවරණ දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ V සහ W |

| ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය | ලේඛන කොටස්වල ඇතුළත් ප්‍රදේශ |
|---|---|
| බොරැල්ල තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 23 දරණ බොරැල්ල කොට්ඨාශය ඇතුළත් දකුණු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ F, G සහ H යන ඡන්ද කොට්ඨාශ |
| කුරුඳුවත්ත තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 24 දරණ කුරුඳුවත්ත කොට්ඨාශය ඇතුළත් දකුණු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ I සහ J යන ඡන්ද කොට්ඨාශ |
| කොළඹ උසාවිය තැපැල් කාර්යාලය | කොළඹ මහ නගර සභාවේ අංක 10 දරණ අළුත්කඩේ කොට්ඨාශය ඇතුළත් මැද කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ L සහ M යන ඡන්ද කොට්ඨාශ |
| දෙහිවල තැපැල් කාර්යාලය ... | දෙහිවල–ගල්කිස්ස නගර සභාවේ අංක 1 කළුබෝවිල නැගෙනහිර, අංක 2 කළුබෝවිල බටහිර, අංක 3 දෙහිවල උතුර, අංක 4 දෙහිවල දකුණ, අංක 5 නිකපේ–නැදිමාල සහ අංක 7 කව්ඩාන–කරගම්පිටිය සහ කෝට්ටේ–ගල්කිස්ස ගම් කාර්ය සභාවේ අංක 12 දිවුලපිටිය–බෙල්ලන්තර, අංක 13 පැපිලියාන සහ අංක 14 අත්තිඩිය ඇතුළත් වැල්ලවත්ත–ගල්කිස්ස මැතිවරණ දිස්ත්‍රික්කයේ F, G, H, I, J, K, L, M, P, V සහ W ඡන්ද කොට්ඨාශ |
| කොළඹ මහ තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 13 දරණ කොටුව කොට්ඨාශය ඇතුළත් මැද කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ Q ඡන්ද කොට්ඨාශය |
| ග්‍රෑන්ඩ්පාස් තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 3 දරණ මාදම්පිටිය කොට්ඨාශය ඇතුළත් උතුරු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ F, G, සහ H යන ඡන්ද කොට්ඨාශ |
| ග්‍රෑන්ඩ්පාස් තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 8 දරණ ග්‍රෑන්ඩ්පාස් සහ අංක 17 දරණ මාලිගාවත්ත කොට්ඨාශ ඇතුළත් මැද කොළඹ මැතිවරණ දිස්ත්‍රික්යේ H, 1, V, සහ W යන ඡන්ද කොට්ඨාශ |
| හැව්ලොක්ටවුම තැපැල් කාර්යාලය | කොළඹ මහ නගර සභාවේ අංක 25 දරණ තිඹිරිගස්යාය අංක 27 බම්බලපිටිය සහ අංක 28 හැව්ලොක්ටවුම කොට්ඨාශය ඇතුළත් දකුණු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ K, L, M, N, O, P සහ Q යන ඡන්ද කොට්ඨාශ |
| කොල්ලුපිටිය තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 26 දරණ කොල්ලුපිටිය කොට්ඨාශය ඇතුළත් මැද කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ CC සහ DD යන ඡන්ද කොට්ඨාශ |
| කොටහේන තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 4 දරණ කොටහේන නැගෙනහිර ඇතුළත් උතුරු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ I සහ J යන ඡන්ද කොට්ඨාශ |
| කොටහේන තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 5 දරණ කොටහේන බස්නාහිර සහ අංක 6 කොච්චිකඩේ ඇතුළත් මැද කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ A, B, C සහ D යන ඡන්ද කොට්ඨාශ |
| මරදාන තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 21 දරණ දෙමටගොඩ සහ අංක 22 කුප්පියාවත්ත කොට්ඨාශ ඇතුළත් උතුරු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ K, L, M සහ N යන ඡන්ද කොට්ඨාශ |
| මරදාන තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවට අයත් අංක 18 දරණ මරදාන සහ 20 මාලිගාකන්ද කොට්ඨාශ ඇතුළත් මැද කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ X, Y, Z, AA, සහ BB, යන ඡන්ද කොට්ඨාශ |
| මරදාන තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 19 දරණ සුදුවැල්ල කොට්ඨාශය ඇතුළත් දකුණු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ C, D, සහ E, යන ඡන්ද කොට්ඨාශ |
| ගල්කිස්ස තැපැල් කාර්යාලය ... | දෙහිවල–ගල්කිස්ස නගර සභාවේ අංක 6 දරණ ගල්කිස්ස උතුර, අංක 8 ගල්කිස්ස, අංක 9 වටරප්පොල, අංක 10 රත්මලාන බටහිර සහ රත්මලාන නැගෙනහිර ඇතුළත් වැල්ලවත්ත–ගල්කිස්ස මැතිවරණ දිස්ත්‍රික්කයේ N, O, Q, R, S, T, සහ U යන ඡන්ද කොට්ඨාශ |
| මෝදර තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 1 දරණ මෝදර සහ අංක 2 මුට්වෝල් ඇතුළත් උතුරු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ A, B, C, D සහ E යන ඡන්ද කොට්ඨාශ |
| පිටකොටුව තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 7 දරණ සෙන්ට් පෝල්ස්, අංක 9 නිව් බැසාර්, අංක 11 සෙන්ට් සෙබස්ටියන් සහ අංක 12 පිටකොටුව ඇතුළත් මැද කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ E, F, G, J, K, N, O, සහ P යන ඡන්ද කොට්ඨාශ |
| කොම්පඤ්ඤවීදිය තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 14 කොම්පඤ්ඤවීදිය සහ අංක 15 වෑකන්ද ඇතුළත් මැද කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ R, S, T, සහ U යන ඡන්ද කොට්ඨාශ |
| කොම්පඤ්ඤවීදිය තැපැල් කාර්යාලය ... | කොළඹ මහ නගර සභාවේ අංක 16 දරණ හුණුපිටිය කොට්ඨාශය ඇතුළත් දකුණු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ A සහ B යන ඡන්ද කොට්ඨාශ |
| වැල්ලම්පිටිය තැපැල් කාර්යාලය ... | කොළොන්නාව නගර සභාවේ අංක 1 දරණ කොළොන්නාව, අංක 2 සාලමුල්ල, අංක 3 නාගහමුල්ල, අංක 4 වැල්ලම්පිටිය, අංක 5 මීතොටමුල්ල, අංක 6 ඌරුගොඩවත්ත සහ අංක 7 වෙහෙරගොඩ ඇතුළත් උතුරු කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ O, P, Q, R, S, T, U- සහ V යන ඡන්ද කොට්ඨාශ |
| වැල්ලවත්ත තැපැල් කාර්යාලය ... | කොළඹ මහඃගර සභාවේ අංක 29 දරණ වැල්ලවත්ත උතුර සහ අංක 30 වැල්ලවත්ත ඇතුළත් වැල්ලවත්ත–ගල්කිස්ස මැතිවරණ දිස්ත්‍රික්කයේ A, B, C, D සහ E යන ඡන්ද කොට්ඨාශ |

3. අයිතිවාසිකම් පිළිබඳ ඉල්ලීම් හෝ විරුද්ධතාවන් ඉදිරිපත් කිරීමට කැමති අය 1958 නොවැම්බර් මස 28 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන ව්‍යවස්ථානුකූල දැන්වීම අනුව එසේ කළ යුතුය. මෙම දැන්වීම එදින ප්‍රවෘත්ති පත්‍රයන්හි ද පළකරනු ලැබේ. අයිතිවාසිකම් පිළිබඳ ඉල්ලීම් හා විරුද්ධතාවන් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ආකෘතිපත්‍ර, ඡන්දදායක නාම ලේඛණ පරීක්ෂා කිරීම සඳහා ප්‍රදර්ශනය කර ඇති කාර්යාලවලින් ලබාගත හැක.

ඩී. ජී. ඇල්. මීසෝ,
රෙජිස්ට්‍රාර් ජනරාල් හා
ලියාපදිංචි කිරීමේ නිලධාරි කෘක

වර්ෂ 1958ක්වූ නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දී ය.

## 4 ඒ පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පකිස්තානි නිවැසි (පුරවැසි) පණත

#### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලෙඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පණතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම්, කුමන කාරණ නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබ්ද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ දින සිට මාසයක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයකුගේ සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස්තැන.

1958ක්වූ නොවැම්බර් මස 18 වෙනි දින,
කොළඹ.

#### උපලේඛනය

| ඉල්ලුම් පත්‍රයෙහි නොම්මරය සහ දිනය | | ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල |
|---|---|---|
| F 7240—31.7.51 | ... | මුත්තුසාමි රාමායිඅම්මාල්, මුතෝලියහේන වත්ත, දෙල්තොට |
| H 7112/G—21.7.51 | ... | කෝවිල්පිල්ලෙයි ජෝන්, 136, කොළඹ පාර, මහනුවර |
| H 4753—26.5.51 | ... | වෙල්ලකුට්ටි කන්දසාමි, මහවුසාවත්ත, මඳුල්කැලේ |
| H 7463—25.7.51 | ... | මුත්තයියා පිල්ලෙයිගේ වැන්දඹුවවූ සිවගාමු අම්මාල්, අංක 45, පන්සලවත්ත, වත්තේගම. |
| K 5953/J—24.5.51 | ... | වෙල්ලයන් නල්ලයියා, ඇල්. ඩී. කේ., වෙලේඔය වතුයාය, හැටන් |
| K 13423—3.8.51 | ... | මුක්කන් වීරයියා, අංක 88, ඉන්දියා ස්ටෝර්ස්, කොටියාගලබසාර්, බගවන්තලාව |
| P 6347—17.2.51 | ... | කරුප්පන් සුබ්‍රමානියම්, ක්ලයිඩ්ස්ඩේල් වත්ත, අග්‍රපතන |
| P 6735—4.3.51 | ... | නාරායනන් රාමු, ඇල්බියන් වත්ත, අග්‍රපතන |
| Y 5906—14.7.51 | ... | කරුපයියා වීරයියා, ඔලියමන්ඩි වත්ත, බදුල්ල |
| AA 5195—4.8.51 | ... | මරුද්මුත්තු සන්දනම්, අළුත්මහවෙල වත්ත, රත්නපුර |

---

## 4 බී පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

#### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලේඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පණතේ 4වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්තිය යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරණ නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබ්ද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධකළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ, සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

#### උපලේඛනය

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස්තැන.

කොළඹ, 1958වූ නොවැම්බර් මස 18 වෙනි දිනදීය.

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අනාය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|---|
| F 1367—4.4.51 | ... | කානා පෙරියන්නපිල්ලෙයි සෙවෙන්තියාපිල්ලෙයි, මීල්ල ගහවත්ත වත්ත, තලාකුඹුය | | තයම්මාල් (භාය්‍යාව), පෙරියන්නන් (පුතා), කයිලාම්බාල් (දුව), රාජාරාම් (පුතා), බාලසරස්වති (දුව), තෙය්වානෙයිඅම්මාල් (දුව) |
| F 2018—27.3.51 | ... | ආරුමුගම් පොන්නුසාමි, කිතුලමුල වත්ත, ගලහවතුයාය, ගලහ | | කන්නම්මා (භාය්‍යාව), සාති නොහොත් සාතිඅම්මා (දුව) |
| F 4425—14.7.51 | ... | මුනියන්ඩි සන්දනම්, උඩතැන්නිය, මාරස්සන | ... | සන්දනමාරි (භාය්‍යාව), පලනියායි (දුව), ඉරුලායි (දුව), තන්ගම්මා (දුව), සෝලෙයිඅම්මා (දුව) |
| F 4727—16.7.51 | ... | ආන්ඩියප්පන් මාරියප්පන්, එරින් වත්ත, ගලහ | ... | තෝට්ච්චි (භාය්‍යාව), කරුප්පයියා නොහොත් සුප්පයියා (පුතා), සින්නපිල්ලෙයි (දුව), සුබ්‍රමානියම් (පුතා), රාමායි (දුව) |
| F 6481—23.7.51 | ... | මාවඩිකෝයිල් තෝට්ටියප් පාහුසාරියර් වීරප්පාපිල්ලෙයිගේ වැන්දඹුවවූ අරවම්මාල්, එරින් වත්ත, ගලහ | | විජයලෙච්චිමි (දුව), විස්වනාදන් (පුතා), රාජේන්දිරන් නොහොත් අරුනාචලම් (පුතා) |
| F 7298—6.10.50 | ... | ඇස්. ඇන්. නාරායනන් සර්වෙයි නොහොත් සුප්පයියා, ''පීල්ඩ් වීව්'' බංගලාව, පේරාදෙනිය | | අන්ගුපිල්ලෙයි (භාය්‍යාව) |
| M 2108/G—16.4.51 | ... | ජෝන් දේවසගායම් දේවපිරියම්, මහජන සෞඛ්‍ය පරීක්ෂක තැන, පූජාපිටිය | | ඇලිස් දේවනේසම් (භාය්‍යාව), මේබල් නාලිනිදේවි (දුව), එව්ලින් දෙල්වදේවි (දුව), ඥානකන් සැමිලින් ධර්ම දෙරෙයි (පුතා) |
| H 584—24.11.50 | ... | අරුනාසලම්පිල්ලෙයි නල්ලතම්බි, අංක 5, මාතලේ පාර, වත්තේගම | | නාගම්මා (භාය්‍යාව), රාජේස්වරි (දුව), ෂන්මුගම් (පුතා), පරමේස්වරි (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| H 1983—19.1.51 | ... වෙල්ලයන් සින්නකරුප්පන්, දියනිල්ල වත්ත, මදුල්කැලේ | මුනිඅම්මාල් (භාර්‍යාව), මුක්කායි නොහොත් අලගු (දුව), පේච්චි නොහොත් අලගු (දුව), අලගන් නොහොත් පෙරියාම්බුලෙයි (පුතා), සින්නයියා (පුතා), ඊලකන්නි (දුව), බාලසුන්දරම් (පුතා) |
| H 6645—18.7.51 | ... මරුදමුත්තු කන්දයියා, බටගල්ල කොටස, නකල්ස් වතුයාය, මදුල්කැලේ | සරස්වතී (භාර්‍යාව), රාජරත්නම් (පුතා), ලෙච්චුමී (දුව), සරෝජා (දුව), මල්ලියසුන්දරම් (දුව) |
| H 8871—1.8.51 | ... අබ්දුල්ලා ඊබ්‍රාහිම්, ගල්බොඩ වත්ත, මුදුල්කැලේ ... | ආච්චිඅම්මා (භාර්‍යාව), මීරන් බීබී (දුව), නාගූර් පිච්චෙයි (පුතා), නාගූර් අම්මා (දුව), අබ්දුල් හමීඩ් (පුතා), අමීනා අම්මා (දුව) |
| H 8922—2.8.51 | ... ආරෝකියම් සන්දනම් නොහොත් ඉන්නාසිමුත්තු, දෙඩන්ගල්ල වත්ත, ඌරුගල | අත්පුතමේරි (භාර්‍යාව) |
| H 627/N/H—30.9.50 | ... රාමන් අලගන්, ගැල්පිල් වතුයාය, පන්විල ... | මරියනායගම් (භාර්‍යාව), මයිකල් (පුතා), අන්තෝනි අන්තෝනිමුත්තු (පුතා), අන්තෝනි අම්මාල් (දුව), ඇන්ටනිස් මරියම්මාල් (දුව), ඇන්ටනිස් ඩේනියල් (පුතා) |
| J 11154—3.8.51 | ... පෙරුමාල් තේවරාජා පිල්ලෙයි, අංක 12, බසාර්, අප්කොට්... | වල්ලිඅම්මෙයි (භාර්‍යාව) |
| J 11202—3.8.51 | ... වේදමුත්තු හැන්රි විලියම්ස්, ගාට්මෝර් වතුයාය, මස්කෙළිය | යේසුදියාල් (භාර්‍යාව), ඔගස්ටින් (පුතා), හෙලන් නොහොත් මේරි සෙල්ලම් (දුව), ක්‍රිස්තෝපර් (පුතා), පීටර් විල්ප්‍රඩ් (පුතා), හිබර්ට් වෝල්ටර් (පුතා), ලිලී අර්පුතමේරි (දුව), ඩෝරා (දුව), වික්ටර් (පුතා) |
| J 11217—30.7.51 | ... අම්මාසි කදිර්වේල්, ඉන්වේරි වත්ත, දික්ඔය ... | මාරයායි (භාර්‍යාව), අස්වතම්මා නොහොත් පෙරියම්මාල් (දුව), සිවපාකියම් නොහොත් ජයම් (දුව), තන්ගවේල් නොහොත් තිරුනාවකරසු (පුතා), රාජා නොහොත් පලනියායි (දුව), සුබ්‍රමානියන් නොහොත් වේළු (පුතා), පුවනේස්වරි (දුව), සෙල්වම් (දුව) |
| J 11286—22.7.51 | ... වේළු පෙරියසාමි, ගෙඩස් කොටස, මෝරේ වතුයාය, මස්කෙළිය | වල්ලිඅම්මා (භාර්‍යාව), තනපාකියම් (දුව), සිවනාදියන් (පුතා), සිවනාදන් (පුතා) |
| J 11560—22.7.51 | ... කරුප්පන් මුත්තුසාමි, බාර්ගෲ වත්ත, මස්කෙළිය ... | අන්ගම්මා (භාර්‍යාව) |
| J 11719—29.7.51 | ... මුත්තු මුරුගන්, ග්ලෙනුගී වත්ත, මස්කෙළිය ... | ආරායි (භාර්‍යාව), අන්නකිලි නොහොත් අන්ජලේ (දුව), කිට්නසාමි (පුතා), ගෝවින්දම්මා (දුව), සරවනමුත්තු (පුතා), අන්නලෙච්චුමි (දුව), මුත්තුමාරි (දුව) |
| J 11778—2.8.51 | ... පලනියන්ඩි සෙල්ලමුත්තු, බ්‍රවුන්ලෝ වත්ත, මස්කෙළිය ... | පාප්පු (භාර්‍යාව), සෙල්ලදුරෙයි (පුතා), සාම්බසිවම් (පුතා) පත්මාවති (දුව) |
| K 2925/J—8.3.51 | ... ප්‍රැන්සිස් අන්තෝනිමුත්තු මරියසූසෙයි, ප්‍රෙස්ටන් වත්ත, අග්‍රපතාන | සවේරිමුත්තු (පුතා), මදලෙයිඅම්මාල් (දුව), ජේසුදසන් (පුතා), අන්තෝනිඅම්මා නොහොත් ථරියා පතිමා (දුව), ප්‍රැන්සිස් (පුතා) |
| K 4590/J—23.5.51 | ... නල්ලකරුප්ප තේවර් රාමු තේවර් නොහොත් රාමසාමි මුත්තයියා, අංක 18, කෙළින් වීථිය, මස්කෙළිය | මරිඅම්මාල් (භාර්‍යාව), පත්මනාදන් (පුතා) |
| K 5915/J—24.5.51 | ... රෙන්ගසාමි වෙල්ලයන්ගේ වැන්දඹුවවූ මාගප්පන් කදිරායි, ඇල්. ඩී. කේ., වෙලේඔය වතුයාය, හැටන් | කරුප්පයියා (පුතා), ආරුමුගම් (පුතා) |
| K 5966/J—24.5.51 | ... රාමසාමි කිට්නන්, ඇල්.ඩී.කේ., වෙලේඔය වතුයාය, හැටන් | පාප්පාති (භාර්‍යාව), සුබ්‍රමානියන් (පුතා) |
| K 6178/J—31.5.51 | ... රෙන්ගන් සින්නන්, වෙලේඔය වත්ත, හැටන් ... | රාමායි (භාර්‍යාව), මුත්තුසාමි (පුතා), ආරුමුගම් (පුතා) |
| K 6477/J—31.5.51 | ... සින්නකන්නු වේළු, වෙලේඔය වත්ත, හැටන් ... | පොන්නම්මාල් (භාර්‍යාව), රාමචන්දිරන් (පුතා) |
| K 6621/J—31.5.51 | ... වීරන් සෙවන්නාදි, ඉහළ කොටස, වෙලේඔය වත්ත, හැටන් | සෙවනායි (භාර්‍යාව) කාමාච්චි (දුව) |
| K 6701/J—31.5.51 | ... කරුප්පයියා පෙරියසාමි, ඉහළ කොටස, වෙලේඔය වත්ත, හැටන් | සීතායි (භාර්‍යාව), රාක්කම්මා නොහොත් අලගම්මා (දුව) කමලම් (දුව), බාලසුන්දරම් (පුතා), සෙල්වරානි (දුව) |
| K 6707/J—31.5.51 | ... පෙරිය රෙන්ගසාමි සන්දනම්, ඉහළ කොටස, වෙලේඔය වත්ත, හැටන් | අමිර්දම් (භාර්‍යාව), ක්‍රිෂ්නන් (පුතා), දෙරෙයිසාමි (පුතා), රාමසාමි (පුතා), පාක්කියම් (දුව), සෙල්වරානී (දුව) |
| K 9402/J—30.7.51 | ... මුත්තයියා චෙට්ටියාර් වඩිවේළු චෙට්ටියාර් වටවල ගබඩාව, වටවල | පූරනම්මාල් (භාර්‍යාව) |
| K 8689—22.7.51 | ... කාලියන් මෙයියන් නොහොත් ආරුමුගම්, ප්‍රයිඩ්ලන්ඩ් වත්ත, බගවන්තලාව | කරුප්පායි (භාර්‍යාව), කන්දයියා නොහොත් කාලියන් (පුතා), සිවගුරු (පුතා) |
| K 9294—27.7.51 | ... සොක්කලිංගම් මෙයියප්පන්, කේ. ඒ. සින්නයියා මහතා බාරේ, අංක 6 කණ්ඩායම, සී. ජී. ආර්. නානුඔය | මුත්තම්මාල් (දුව), කරුප්පයියා (පුතා), කාමාච්චී (දුව) |
| K 9823—31.7.51 | ... පෙරුමාල් කොලන්දෙයි, සීමාසහිත හැටන් බැන්කුව, හැටන් | කාලිඅම්මා (භාර්‍යාව), වල්ලිඅම්මා (දුව), සිවලිංගම (පුතා), සුප්පයියා (පුතා) |
| K 10167—6.7.51 | ... ආචාදෙයි සුප්පන්, බෝගවන කොටය, බෝගවන වතුයාය, බගවන්තලාව | මුක්කායි (භාර්‍යාව), කදිර්වේළු (පුතා), මානික්කම් (පුතා), සන්දනම් (පුතා), මෙයියා (දුව), පලනියන්ඩි (පුතා) |
| K 11219—3.8.51 | ... මාදන් සන්දනම් නොහොත් සන්දනම් ඇලෙක්සැන්ඩර් ඩේනියල්, සීමාසහිත බ්‍රවුන් සහ සමාගම හැටන් | ලූර්දුමේරි නොහොත් සන්දනම් (භාර්‍යාව), එළිසබෙත් ෆේපලිසිටි සරස්වති (දුව), අරුලානන්දම් සැමුවෙල් (පුතා) |
| K 12794—4.8.51 | ... ජෙගනාදන් ජෙගනාදන් බින්ඔය වත්ත, රොසැල්ල ... | සෙල්ලම් (භාර්‍යාව), ලෙච්චුමී කාන්දන් (පුතා), ජය ලෙච්චුමී (දුව), සිවපාකියම් (දුව), ජෙගනාදන් (පුතා), සාතාසි (දුව) |
| K 12944—31.7.51 | ... මුත්තුකරුප්පන් පෙරිය කරුප්පන්, බින්ඔය වත්ත, රොසැල්ල | වේලම්මා (භාර්‍යාව), ක්‍රිෂ්නන් (පුතා), ක්‍රිෂ්නාවනි (දුව), නීලවර්නන් (පුතා) |

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරිමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නාම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| J 530/K—27.4.51 | … මුනියන්ඩි ජෝන් වෙල්ලයියා, ජාතික උද්‍යානය, ගිල්ස්ටන්, රොසැල්ල | වල්ලිඅම්මා (භාර්‍ය්‍යාව), මනෝන්මනි (දුව), සෙල්වනායගම් (පුතා), සුබ්‍රමානියම් (පුතා), කනගරත්නම් (පුතා), විසුවනාදන් (පුතා), රුක්මනි (දුව), විවේකානන්දම් (පුතා), නේසම් (පුතා) |
| P 4450/K—30.11.50 | … කුල් අයිනාන්, බාත්ෆෝඩ් පැක්ටෙරිය, ඉන්ගෙස්ටර් වතුයාය, දික්ඔය | අන්ගම්මා නොහොත් මරුදයි (භාර්‍ය්‍යාව), මාරියප්පන් නොහොත් ප්‍රැන්සිස් ක්‍රිස්තෝපර් අන්තෝනි නොහොත් අරසන් (පුතා), රාජලෙච්චුමි නොහොත් මාරියායි නොහොත් රෝස්මේරි (දුව), ක්‍රිෂ්නම්මා නොහොත් ලෙච්චුමි නොහොත් තෙරේසින් මරියා ක්ලේරා (දුව), සරස් නොහොත් සරස්වතී නොහොත් මාගරට් මරියා ලෝරා (දුව), සෙල්වම්මා නොහොත් සෙල්වම් නොහොත් ගර්ට්‍රෑඩ් මරියා සෙල්වම් (දුව), ආනන්ද ලෙච්චුමි (දුව) |
| N 2482—26.8.50 | … තිරුමාලෙයි වේළු, ඉහළ කොටස, දන්සිනේන් වත්ත, පුන්දුල් ඔය | කරුප්පි (භාර්‍ය්‍යාව) |
| N 7222—13.5.51 | … සිගාමනි අබිසේගම්, ලබුකැලේ කොටස, ලබුකැලේවත්ත, ලබුකැලේ | පාක්කියම් (භාර්‍ය්‍යාව) |
| Y 4229/V—4.7.51 | … වේලයුදන් පලනියන්ඩි තන්ගවේළු, වැවැස්ස වතුයාය, බදුල්ල | පලනිඅම්මාල් (භාර්‍ය්‍යාව), පරමසිවම් (පුතා), පුස්පම්මාල් (දුව), අරුනාසලම් (පුතා), වේලයුදම් (පුතා), යෝගලෙච්චුමි (දුව), පරමේස්වරි (දුව), පලනියන්ඩි (පුතා), තිරුමුරුගම් (පුතා) |
| W 3601/V—25.5.51 | … ගෝවින්දන් අන්නමලෙයි, කොකෝගල්ල වත්ත, මඳුල්සිම | තෙයිවානෙයි (භාර්‍ය්‍යාව), ලෙච්චුමි (දුව), මුරුගායි (දුව), සිවලිංගම් (පුතා), මනෝන්මනි (දුව) |
| Y 2699—20.5.51 | … රාමන් ලෙච්චුමන්, ඌවකැටවෙල වත්ත, හාලිඇල … | පාප්පායි (භාර්‍ය්‍යාව), පෙරුමාල් (පුතා), සින්නන් (පුතා), කරුප්පායි (දුව), තේවමනි (දුව), තියාගරාජා (පුතා), මෝහනදස් (පුතා) |
| Y 2702—20.5.51 | … නාරායනන් සුබ්‍රායන්, ඌවකැටවෙල වත්ත, හාලිඇල … | මීනාච්චි (භාර්‍ය්‍යාව), සුප්‍රමානියම් (පුතා), පෙරුමාල් (පුතා), වේළු (පුතා) |
| Y 2789—30.5.51 | … රෙන්ගන් සින්නයියා, 7වෙනි කොටස, ස්ප්‍රින්වැලි වතුයාය, ස්ප්‍රින්වැලි | සෙලම්බායි (භාර්‍ය්‍යාව), පලනියායි (දුව), මීනාච්චි (දුව) පලනිවේල් (පුතා), නඩරාජා (පුතා) |
| Y 7350—28.7.51 | … මුක්කන් තම්බු, කුල්ලන් වත්ත, බදුල්ල … | එල්ලම්මා (භාර්‍ය්‍යාව), සින්නම්මා (දුව), නල්ලයියා (පුතා) ගෝපාල් නොහොත් රාජගෝපාල් (පුතා), ක්‍රිෂ්නන් (පුතා) |
| Y 7253—28.7.51 | … වීරසාමි වඩිවේල්, කුල්ලන් වත්ත, බදුල්ල … | කරුප්පායි (භාර්‍ය්‍යාව), පොට්ටු (දුව), සෙල්වම් (පුතා), සෙල්ලයියා (පුතා) |
| Y 7279—23.7.51 | … වෙල්ලසාමි කන්දන්, කුල්ලන් වත්ත, බදුල්ල … | සින්නු (භාර්‍ය්‍යාව), වේලයිදන් (පුතා), පෙරුමාල් (පුතා), ජේච්චායි (දුව), පාර්කවි (දුව), තාත්තම්මා (දුව), නඩරාජා (පුතා) |
| U 1884—27.7.51 | … ඇලෝසියුස් බෙනෙඩික් ප්‍රනාන්දු නොහොත් ටී. ඒ. බෙනෙඩික් ප්‍රනාන්දු, 27 සහ 29, පුත්තලම පාර, කුරුණෑගල | කුලන්දෙයි තෙරේස් සින්නරානි (භාර්‍ය්‍යාව), තෝමස් ජෝන් පීටර් ජෝශප් (පුතා), තෝමස් නෙවිස් නිර්මල් (පුතා), රොසරියෝ කැලිස් ප්‍රියදර්ශනී (දුව), එතල් රිකා ඇන්ටනනීටා අරුමා (දුව) |
| CC 4090—22.7.51 | … නාරායනකවුන්දන් සින්නයියා, දෙබත්ගම වතුයාය, අරනායක | මාරියායි (භාර්‍ය්‍යාව), සින්නම්මා (දුව), තන්ගවේළු (පුතා), තර්මලිංගම් (පුතා), වේලයිදන් (පුතා), නාරායනන් (පුතා), ආනන්දයි (දුව), පුන්ගාවනම් නොහොත් අන්ජලෙයි (දුව), සතිවේළු (පුතා) |
| DD 2463—19.4.51 | … මුත්තුවීරන් මරදෙයි, පහළ කොටස, ලැවන්ට් වත්ත, යටියන්තොට | මාරියායි (භාර්‍ය්‍යාව), පලනියායි (දුව), වීරමලෙයි නොහොත් සින්න මරදෙයි (පුතා), සන්මුගම් (පුතා), කනේසන් (පුතා), පාලායි (දුව), පාරුවතී (දුව), යේලුමලෙයි (පුතා), තෙයිවානෙයි යම්මා (දුව), කුරුසාමි (පුතා), තන්ගවේළු (පුතා) |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රජයේ ප්‍රකාශන කාර්‍යාංශය වසා තැබීම

රජයේ ප්‍රකාශන කාර්‍යාංශය සහ මහ තැපැල් කන්තෝරු ගොඩනැගිල්ලේ පිහිටි ශාඛා ආයතනය වාර්ෂික ගණන් ගැනීම සඳහා මෙම නොවැම්බර් මස 24 වැනි දින වසා තබන බව මහාජනයා වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඇල්. ප්‍රනාන්දු,
වැඩ බලන ප්‍රචාරක්ති නිලධාරි.

ප්‍රචාරක්ති දෙපාර්තමේන්තුව,
කොළඹ 1. නොවැම්බර් 18, 1958.

---

### "හෙමරජික් සෙප්ටිසිමියා" නැමැති භයානක රෝගය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ උඩුකහ කෝරළේ මීරිහෙලිය හා අලව්ව පළාතේ ගවයින් අතර "හෙමරජික් සෙප්ටිසිමියා" නැමැති රෝගය පැතිරී යන බැව් බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වෙනි වගන්තියේ 1 වෙනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාත් ලෙස මා විසින් වර්ෂ 1958ක්වූ ජූලි මස 25 වෙනි දින නො. 11,436 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහදිසාපතිතුමා.

12.11.1958.
කච්චේරිය. කුරුණෑගල.

---

### "කුරලෙඩ සහ කටලෙඩ" නමැති භයානක රෝගය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ මාගුල් ඕතොට කෝරළයේ ගවයින් අතර "කුරලෙඩ සහ කටලෙඩ" නමැති රෝගය පැතිරී යන බැව් බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වෙනි වගන්තියේ 1 වෙනි අතුරු වගන්ති යයටතේ බෝවන රෝග ඇති පළාත් ලෙස මා විසින් වර්ෂ 1958ක්වූ අගොස්තු මස 1 වෙනි දින නො. 11,465 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල. දිස්ත්‍රික්කයේ මහදිසාපති.

13.11.1958.
කච්චේරිය, කුරුණෑගල.

## පිස්සු බල්ලන්ගෙන් අන්තරා

පිස්සු බල්ලන් සම්බන්ධ ආඥාපණතේ 11 වැනි රෙගුලාසියේ ප්‍රකාර දන්වන්නේ නම් වැල්ලවාය ප්‍රාදේශිය ආදයම් නිළධාරි කොට්ඨාශයේ උඩවේරිය වතුයායේ පිස්සු බල්ලන්ගෙන් අන්තරා, පිස්සු බලු රෝගය තිබෙන බවයි. එබැවින් මෙහි ඉහත සඳහන් වසම තුළ නොබඳිනලද හෝ අල්ලා නොගෙන යන බල්ලෙක් අන් කෙනෙකුගේ ගෙදරක, මිදුලක හෝ වත්තක ඇර ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ වෙනයම් ස්ථානයක සිටියොත් බලයලත් කෙනෙකුට ඌ වහාම මරාදමන්ට පුළුවන් බව මෙයින් දන්වනු ලැබේ.

මෙම ප්‍රකාශය අද සිට වලංගු බවත්, එය මාස 6ක් යනතුරු වලංගුව පවතින බවත්, මෙයින් දන්වමි.

ටී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බදුලු දිස්ත්‍රික්කයේ ඒජන්ත තුමා.

1958ක්වූ නොවැම්බර් මස
බදුලු කච්චේරියේ දීය.

---

# "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම්

## සුරාබදු පනත

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල නගර සහා ප්‍රදේශයේ අරක්කු තැබෑරුම නැවත විවෘත කිරීම පිළිබඳ ප්‍රදේශ කැමැත්ත විමසීමේ දැන්වීමයි

කුරුණෑගල නගර සහා ප්‍රදේශයෙහි අරක්කු තැබෑරුම නැවත විවෘත කිරීම සම්බන්ධව ඡන්ද දයක ලැයිස්තුවේ සංඛ්‍යාවෙන් සියයට 60ක් මෙහි කියන ලද අරක්කු තැබෑරුම නැවත විවෘත කිරීම සඳහා කැමැත්ත දෙනු ලැබේද දැන ගණු සඳහා කුරුණෑගල රජයේ දිසාපතිතුමා විසින් 1923 අගෝස්තු 14 වෙනි දින අංක 7,478 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ අංක146 දරණ සුරාබදු දැන්වීමේ 6 වෙනි නීතියෙන් සහ 180, 187, 194, 221, 225 සහ 231 දරණ සුරාබදු දැන්වීම් වලින් එතුමා වෙත පවරන ලද බලය අනුව පහත සඳහන් දින, කාල සහ ස්ථානයේදී කැමැත්ත විමසීමක් කරන බව මෙයින් දන්වා සිටිමි—

තැබෑරුමේ නම : කුරුණෑගල අරක්කු තැබෑරුම,

කැමැත්ත විසඳීමේ දිනය සහ වේලාව : 1958 දෙසැම්බර් 19 වෙනි දින, උදේ 8 සිට 12 දක්වා සහ සවස 1 සිට 6 දක්වා,

කැමැත්ත විමසන ස්ථානය : කුරුණෑගල නගර ශාලාව,

කැමැත්ත විමසන ප්‍රදේශය : කුරුණෑගල නගර සභා ඡන්ද කොට්ඨාශයේ අංක 2, 3, 5, 6, 8 සහ 9 යන කොට්ඨාශයන් ය.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

1958 නොවැම්බර් මස 8 වෙනි දින,
කුරුණෑගල කච්චේරියේ දීය.

---

## සුරාබදු පනත

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම නගරයේ අරක්කු තැබෑරුම නැවත විවෘත කිරීම පිළිබඳ ප්‍රදේශ කැමැත්ත විමසීමේ දැන්වීමයි

මාවතගම නගරයේ අරක්කු තැබෑරුම නැවත විවෘත කිරීම සම්බන්ධව ඡන්දදයක ලැයිස්තුවේ සංඛ්‍යාවෙන් සියයට 60 ක් මෙහි කියන ලද අරක්කු තැබෑරුම නැවත විවෘත කිරීම සඳහා කැමැත්ත දෙනු ලැබේද දැන ගනු සඳහා කුරුණෑගල රජයේ දිසාපතිතුමා විසින් 1923 අගෝස්තු 14 වෙනි දින අංක. 7,478 දරණ රජයේ ගැසට් පත්‍රයේ පල වූ අංක. 146 දරණ සුරාබදු දැන්වීමේ 6 වෙනි නීතියෙන් සහ 180, 187, 194, 221, 225 සහ 231 දරණ සුරාබදු දැන්වීම් වලින් එතුමා වෙත පවරන ලද බලය අනුව පහත සඳහන් දින, කාල සහ ස්ථානයේදී කැමැත්ත විමසීමක් කරන බව මෙයින් දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| තැබෑරුමේ නම | ... | මාවතගම අරක්කු තැබෑරුම |
| කැමැත්ත විසඳීමේ දිනය සහ වේලාව | | 1958 දෙසැම්බර් මස 12 වෙනි දින, උදේ 8 සිට 12 දක්වා සහ සවස 1 සිට 6 දක්වා |
| කැමැත්ත විමසන ස්ථානය | ... | මාවතගම රෝමානු කතෝලික පාඨශාලාව |
| කැමැත්ත විමසන ප්‍රදේශය | ... | කොටිකාපොල, ඔලියාමුල්ල, රඹත්ත, වැලිකුඹුර, අරම්පොල, මාවතගම, සීරාදුන්න, මිල්ලගහමුලකඩේ, පල්ලේගම, ඌරාකොටේ, මැදගක්ගොඩ, මැද්දේගන්ගොඩ, පුවන්-වල්ලේදෙනිය, උඩගම, වඹුගන්ගොඩ, එල්ලාගොන්න, නාපේ, යාලේගම, රත්නැක්ගම, ඉලුකේවෙල, දිගන, දෙල්පද්දන, පහමුන්දන ඕවට්ටේවෙල, සහ පාඹේ යන ග්‍රාමයන්ය. |

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒජන්තතුමා.

1958 නොවැම්බර් මස 8 වෙනි දින,
කුරුණෑගල කච්චේරියේදීය.

---

## විශෙෂ නිවේදනයයි

1958 නොවැම්බර් 25 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 නොවැම්බර් 28 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1958 නොවැම්බර් 24 වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 නොවැම්බර් 11 දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.